# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1400/24 – 2005 ජූලි 08 වැනි සිකුරාදා – 2005.07.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මම, ඉහත කී පනතේ 24අ වගන්තියේ (I) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු 24ආ වගන්තියේ (I) වැනි උපවගන්තිය යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ, සෞන්දර්ය අධ්‍යයන ආයතනය පිහිටුවමින් කරන ලැදැයි සැලකෙන නියෝගය, 2005 ජූනි 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් පරිච්ඡින්න කරමි.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2005 ක් වූ ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

07 – 591/1

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) ඡේදය සමඟ කියවිය යුතු 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්, –

(අ) දෘෂ්‍ය සහ නිර්මාණාත්මක කලාවන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය සැලසීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා ද එම කලාවන් අදාළවන සෞන්දර්යාත්මක සහ ව්‍යවහාරික මානයන්හි විශිෂ්ට ප්‍රමිතියක් ඇති කිරීම සඳහා ද 2005 ජූලි මස 01 දින සිට විශ්වවිද්‍යාලයක් පිහිටුවමි ;

(ආ) එම විශ්වවිද්‍යාලයට " සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය " යන නාමය සහ අභිධානය ලබා දෙමි ;

(ඇ) එම විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටුවනු ලැබිය යුතු ස්ථානය කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත විය යුතු බවට සඳහන් කරමි ;

(ඈ) තෝරාගත් විෂයයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබා ගැනීමේ හැකියාව ඇතිව ශිෂ්‍යයන්ට ඉතා හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ ඇතිව විෂයයන් රාශියකට අදාළ පාඨමාලා කීපයක් විශ්වවිද්‍යාලය විසින් ඇති කළ යුතු බවට නියම කරමි ;

(ඉ) මෙහි උපලේඛනයේ I වැනි තීරයේ සහ II වැනි තීරයේ දක්වා ඇති පීඨ සහ අධ්‍යයන අංශවලින් එම විශ්වවිද්‍යාලය සමන්විත විය යුතු බව නියම කරමි.

## උපලේඛනය

| *I වැනි තීරය* පීඨ | *II වැනි තීරය* අධ්‍යයන අංශ |
|---|---|
| 1. දෘෂ්‍ය කලා පීඨය | 1. චිත්‍රකලා අධ්‍යයනාංශය ;<br>2. මූර්ති කලා අධ්‍යයනාංශය ;<br>3. දෘෂ්‍ය සන්නිවේදන නිර්මාණ අධ්‍යයනාංශය ;<br>4. බහු ශික්ෂණාත්මක නිර්මාණ අධ්‍යයනාංශය ;<br>5. මුද්‍රණ කලා අධ්‍යයනාංශය ;<br>6. රෙදිපිළි සහ ඇඟලුම් කලා අධ්‍යයනාංශය ;<br>7. සෙරමික් අධ්‍යයනාංශය ;<br>8. ඉතිහාසය සහ කලා සිද්ධාන්ත අධ්‍යයනාංශය ;<br>9. බහු මාධ්‍ය කලා අධ්‍යයනාංශය. |
| 2. නර්තන හා නාට්‍ය කලා පීඨය | 1. උඩරට නර්තන අධ්‍යයනාංශය ;<br>2. පහතරට නර්තන අධ්‍යයනාංශය ;<br>3. සබරගමු නර්තන අධ්‍යයනාංශය ; |

4. වාද්‍ය සංගීත අධ්‍යයනාංශය ;
5. ඉන්දියානු සහ ආසියානු නර්තන අධ්‍යයනාංශය ;
6. නාට්‍ය කලා, මුද්‍රා නාට්‍ය සහ නූතන නැටුම් ; අධ්‍යයනාංශය ;
7. නර්තන රංග කලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය.

3. සංගීත පීඨය

1. උතුරු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීත අධ්‍යයනාංශය ;
2. මානව සංගීත අධ්‍යයනාංශය ;
3. ව්‍යවහාරික සංගීත අධ්‍යයනාංශය ;
4. කර්නාටක සංගීත අධ්‍යයනාංශය ;
5. බටහිර සංගීත අධ්‍යයනාංශය ;
6. තුලනාත්මක සංගීත අධ්‍යයනාංශය.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2005ක් වූ ජුනි 29 වැනි දින,
කොළඹ දී ය.

07 – 591/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.